# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2165/9 - 2020 මාර්තු මස 03 වැනි අඟහරුවාදා - 2020.03.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්පත් කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය :* දෙහි/2-1/2/අත්/748.

දෙහිවල සුපිරි වෙළඳ සංකීර්ණය ඉදිකිරීම සඳහා ඉඩම් ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවයේ විස්තරය:*

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, දෙහිවල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දෙහිවල - ගල්කිස්ස මහ නගර සභා සීමාව තුළ දෙහිවල ගමේ පිහිටි, මැනුම්පති විසින් පිළියෙල කරන ලද, මු.පි.කො. 9882 දරන පිඹුරේ පෙන්නුම් කරන ලද, ප්‍රමාණයෙන් හෙක්. 0.0605 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කැබලි,

මු.පි.කො. 9882:

1. කැබලි අංක 01
ඉඩමේ නම: -; ඉඩම් පරිහරණය: ප්‍රවේශ මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0079.

2. කැබලි අංක 02
ඉඩමේ නම: -; ඉඩම් පරිහරණය: ප්‍රවේශ මාර්ගය; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්. 0.0007.

3. කැබලි අංක 03
ඉඩමේ නම: බෝගහවත්ත; ඉඩම් පරිහරණය: ගෙවත්ත, ස්ථිර ගොඩනැගිල්ලක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: කුට්ටිගල ඡන්දසුමන හිමි, ශ්‍රී සුබෝධාරාම රජ මහා විහාරය, දෙහිවල; ප්‍රමාණය: හෙක්. 0.0519.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියළු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ,

01. මු.පි.කො. 9882 කැබලි අංක 01 - 2020 මැයි 18 වැනි දින පෙ.ව. 10.00
02. මු.පි.කො. 9882 කැබලි අංක 02 - 2020 මැයි 18 වැනි දින පෙ.ව. 11.00
03. මු.පි.කො. 9882 කැබලි අංක 03 - 2020 මැයි 18 වැනි දින ප.ව. 12.00ට දෙහිවල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේදී මා සම්මුඛ විය යුතුය.

තවද, 2020 මැයි මස 04 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ ආකාරයත් මා වෙත පිටපත් 02ක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය. ඔප්පු හා අනෙකුත් ලේඛන පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතුය.

නාලිනී බාලසුබ්‍රමනියම්,
ප්‍රාදේශීය ලේකම්,
දෙහිවල.

2020 මාර්තු මස 02 වැනි දින,
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
154,ගාලු පාර,
දෙහිවල.

03-717

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.